201

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006

පොදු ජාත්‍යන්තර නීතිය - **LWU 3315/4312/4335**

කාලය - පැය (03) තුනයි

---

දිනය - 2006.04.25 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

***<u>ප්‍රශ්න පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.***
***අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.***

01. (අ) රාජ්‍යයන්ගේ අවශ්‍යතාවයන් වල ඒකඟතාවයක් නොමැති වීම හේතුවෙන් ජාත්‍යන්තර නීතියේ සම්මුතිවලට එළඹීම පහසු කටයුත්තක් නොවේ. විවිධ වූ අවශ්‍යතාවයන් සහිත පාර්ශ්වයන්ගේ කැමැත්ත ලබා ගැනීම සඳහා සැලකිය යුතු ඒකඟතාවයක් ඇති කල යුතුව ඇත.

ජාත්‍යන්තර නීතියේ මූලාශ්‍රයක් ලෙස සම්මුතීන්ගේ භූමිකාව සාකච්ඡා කරන්න.

(ආ) ලීමා, ලොව දුප්පත්ම රටවල් අතුරෙන් 52 වන ස්ථානයේ පසුවන සමකාසන්න ස්වාධීන රාජ්‍යයකි. කෙසේ වෙතත් යම් දිනක චන්ද්‍රිකාවක් කක්ෂ ගත කිරීමේ අරමුණින් ලීමා රාජ්‍යය ජෛව ස්ථිතික කක්ෂයෙහි (Geo Stationary Orbit [GSO] ) ස්ථාන 3 ක් සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලියාපදිංචි වී ඇත. ජර්කිස්ථානය ජාත්‍යන්තර විදුලි සංදේශ ව්‍යාපාරයේ නිරත වීමට කැමැත්තෙන් පසුවන ධනවත් රජ්‍යයක් වන නමුදු GSO හි කක්ෂ ස්ථානයක් ලබා ගැනීමට අපොහොසත් වී ඇත. අසල්වැසි රාජ්‍යයක් වන රාමස්ථාන්හි ජනාධිපතිවරයා ලීමා හි ජනාධිපතිවරයා හමු වී ජර්කිස්ථානයට කක්ෂ ස්ථානයක් කුලියට දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වයි. නමුත් එකදු කක්ෂ ස්ථානයක් හෝ කුලියට දීම ලීමා හි ජනාධිපතිවරයා ප්‍රතික්ෂේප කරයි. දින කිහිපයකට පසු ලීමා හි ජනාධිපතිවරයා වෙත රාමස්ථානයේ ජනාධිපතිවරයාගෙන් පණිවිඩයක් ලැබෙන අතර එහි සඳහන් වන්නේ මීට දෙවසරකට පෙර ලීමා සහ රාමස්ථාන් අතර එළඹි දැව වෙනුවට ආහාර ගිවිසුම පිළිබඳ තමාට නැවත සලකා බැලීමට සිදුවන බවයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස අවසානයේදී ලීමා එක් කක්ෂ ස්ථානයක් කුලියට දීම සඳහා ජර්කිස්ථානය සමඟ ගිවිසුමකට එළඹේ. පසුව ලීමා රාජ්‍යයට දැන ගන්නට ලැබෙන්නේ ලීමා නමින් ලියාපදිංචි කර ඇති කක්ෂ ස්ථාන 3 ම ප්‍රයෝජනයට ගනිමින් චන්ද්‍රිකා 3 ක් කක්ෂගත කිරීමට ජර්කිස්ථානය සූදානම් වන බවයි. ලීමා හි ජනාධිපතිවරයා මේ සම්බන්ධව ලීමා වෙත පවතින ප්‍රතිකර්ම පිළිබඳ ඔබගේ උපදෙස් අපේක්ෂා කරයි.

ඔහුට උපදෙස් දෙන්න.

02. ගෝල් ජනරජයේ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය වින් වින් මහතා ජාත්‍යන්තර සමුළුවක් ඇමතීම සඳහා මිසාකා ෆෙඩරල් ජනරජයට පැමිණේ. අමාත්‍යාංශ නිලධාරීන් සහ පවුල්වල සාමාජිකයන්ගෙන් සමන්විත වන අමාත්‍ය පරිවාර පිරිස සඳහා රජයේ අනුග්‍රහය ලබාදීම සාමාන්‍ය සිරිතකි. කෙසේ වෙතත්, මෙම අවස්ථාවේදී පවුලේ සාමාජිකයින්ට අමතරව පෞද්ගලික ලේකම්වරුන් දෙදෙනෙකු ආරක්ෂක නිළධාරීන් තිදෙනෙකු සහ මානව හිමිකම් ක්‍රියාකාරීන් සිව් දෙනෙකු මෙම පරිවාර පිරිසට අයත් වේ.

සමුළුවට පෙර දින වින් වින් මහතා ඔහුගේ බිරිඳ සමගින් සාප්පු සවාරියේ යෙදුනි. එහිදී වින් වින් මහත්මිය සාප්පුවකින් විසිතුරු පළිඟු (crystal) භාණ්ඩ 3 ක් සොරකම් කළාය. ඔහුගේ පුතුන් රාත්‍රියේ දී කැසිනෝ සමාජ ශාලාවකට ගිය අතර බීමතින් සිදුවූ ගැටුමකදී පිහියෙන් ඇන එහි සේවකයෙකු මරා දැමීය.

පසුදින ඇමතිතුමා සමුළුවට සහභාගී වෙමින් සිටියදී, ඔහුගේ ආරක්ෂකයන් හෝටලය ඉදිරිපිට පැවති අරගලයකට සහභාගී වූ අතර පොදු දේපළවලට අලාභහානි සිදු කළහ.

මෙහි අඩංගු නෛතික කරුණු සාකච්ඡා කරන්න.

03. 1961 තානාපති විනිර්මුක්තිය පිළිබඳ වියානා සම්මුතියෙහි පිළිවෙලින් 22, 27 සහ 30 වන වගන්ති සඳහා පහත සඳහන් කොටස් එකතු කිරීම තුළින් වෙනස් කල යුතු බව තානාපති සම්බන්ධතා පිළිබඳ මෑතකදී පත් කරන ලද කමිටුවක් යෝජනා කර සිටී. (යෝජිත වෙනස්කම් වරහන් තුල දක්වා ඇත.)

22 වන වගන්තිය

1. තානාපති භූමිය අනුලංඝනීය වේ. ලබන රාජ්‍යයේ නියෝජිතයන් තානාපති සංගයේ (Mission) ප්‍රධානියාගේ අවසරයකින් තොරව එයට ඇතුළුවීම නොකල යුතු වේ. (එසේ වී මුත්, ජාතික ආරක්ෂාව සහ පොදු යහපැවැත්ම සම්බන්ධයෙන් වන අවශ්‍යතාවයන් හිදී ලබන රාජ්‍යයේ නියෝජිතයන්ට පූර්ව අනුමැතියකින් තොරව ඇතුළු විය හැකිය.)

3. තානාපති භූමිය, එහි ගෘහභාණ්ඩ සහ අනෙකුත් දේපළ සහ තානාපති සංගයේ (Mission) ප්‍රවාහන කටයුතු පරීක්ෂා කිරීමෙන්, ඉල්ලුම් කිරීමෙන්, ඈඳා ගැනීමෙන් හෝ ඇස්කිසිකර විකිණීමෙන් විනිර්මුක්ත වේ. (ලබන රාජ්‍යය විසින් ජාතික ආරක්ෂාව සහ පොදු යහපැවැත්ම සංගයේ (Mission) හැසිරීම මගින් තර්ජනයට ලක් වී ඇතැයි සාධාරණ හේතු මත විශ්වාස කරන විටදී හැර).

27 වන වගන්තිය

2. තානාපති ගමන් මල්ල විවෘත කිරීම හෝ රඳවා තබා ගැනීම නොකල යුතුය. (එසේ වී මුත්, මෙම වගන්තියේ ප්‍රතිපාදනවලට යටත්ව යුක්ති සහගත හේතු මත තානාපති ගමන් මළු විමර්ශනය කිරීමේ අයිතිය ලබන රාජ්‍යය වෙත රඳවා තබා ගනු ලැබේ.)

30 වන වගන්තිය

1. තානාපති නියෝජිතයකුගේ පෞද්ගලික වාසස්ථානයට තානාපති භූමි සඳහා අදාල වන ආරක්ෂාව සහ විනිර්මුක්තිය එලෙසින්ම අදාල වේ. (ජාතික ආරක්ෂාව සහ පොදු යහපැවැත්ම තානාපති සංගයේ (Mission) හැසිරීම මගින් තර්ජනයට ලක් වී ඇතැයි සාධාරණ හේතු මත විශ්වාස කරන විටදී හැර).

සෙලනිකාවේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා මෙම සම්මුතියට යෝජිත වෙනස් කිරීම්/එකතු කිරීම් සම්බන්ධයෙන් ඔබේ උපදෙස් අපේක්ෂා කරයි.

වෙනස් කිරීම්/එකතු කිරීම් හා සම්බන්ධ නෛතික තත්ත්වයන් පිළිබඳ ඔහුට උපදෙස් දෙන්න.

04. (අ) ජාත්‍යන්තර නීතිය යටතේ රාජ්‍යයකට තම රාජ්‍යයෙන් පිටත අධිකරණ බලය යෙදවිය හැකි විවිධ වූ ආකාරයන් පැහැදිලි කරන්න.

(ආ) සිල්වර්ලන්තයේ පුරවැසියෙකු වන මාක් සිල්වර්ලන්තයේ ලියාපදිංචිකර ඇති මැක්රොසොෆ්ට් සමූහයේ කළමණාකරු වශයෙන් සේවය කරයි. මෙම සමාගම වෙළඳ පොලේ විශාල ඉල්ලුමක් පවතින පයිනැපල් සලකුණ දරණ පරිගණක නිපදවයි. සිල්වර්ලන්තයේ සිට ගෝල්ඩ්ලන්තයට නීති විරෝධී ලෙස පරිගණක චිපයන් (chips) අපනයනය කිරීම සම්බන්ධයෙන් චෝදනා නගා, මාක් ග්‍රීකාහිදී අත් අඩංගුවට ගන්නා ලදී. මැක්රොසොෆ්ට් සමූහයට මෙම පරිගණක චිපයන් (chips) සපයනු ලබන්නේ ග්‍රීකාහි ලියාපදිංචි සමාගමක් වන ෆියුචර් ටෙක්නික් සමාගම වන අතර මේ සඳහා වන ගිවිසුම මැක්රොසොෆ්ට් සමූහය මගින් තුන්වන රාජ්‍යයකට පරිගණක චිපයන් (chips) අපනයනය නොකල යුතුය යන කොන්දේසිය මත ක්‍රියාත්මක වේ.

මාක්ට උපදෙස් දෙන්න. ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

05. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩල ස්ථිර සාමාජිකයින්ගේ ගණන වැඩිකල යුතු යැයි බොහෝ ඉල්ලීම් පවතී. ඉන්දියාව වැනි දියුණු වෙමින් පවතින රටවල් ආර්ථික සහ දේශපාලන වශයෙන් වේගයෙන් බලවත් වන විට ලෝක අවශ්‍යතාවයන් සහ බල තුලනය කිරීම සඳහා එවැනි රාජ්‍යයන්ටද ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර සාමාජිකත්වය ලබා දීම වැදගත් වේ.

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? සාකච්ඡා කරන්න.

06. වැන්ග්, රිකෝ රාජ්‍යයේ වැඩියෙන්ම අලෙවි වන පුවත් පතක් වන Rican Herald හි කාටූන් චිත්‍ර ශිල්පියෙකි. ඔහු බැබලූ එක්සත් ජනපදයේ (United State of Babaloo) (USB) ජනාධිපතිවරයා ලොව ප්‍රමුඛතම ත්‍රස්තවාදියා ලෙස හුවා දක්වමින් කාටූන් චිත්‍රයක් පළ කළේය. මෙම කාටූන් චිත්‍රයට අන්තර්ජාලය හරහා පුළුල් ප්‍රසිද්ධියක් ලැබුණි. මෙම කාටූන් චිත්‍රය බැබලූ එක්සත් ජනපදය තුල නොසන්සුන්තාවයක් නිර්මාණය කල අතර USB විසින් වැන්ග්ට එරෙහිව පියවර ගන්නා ලෙස හෝ නැතහොත් ආර්ථික සම්බාධකවලට මුහුණ දෙන ලෙසට රිකෝ හි ජනාධිපතිවරයාට බල කර සිටී. මෙහි ප්‍රතිඵලයක් ලෙස රිකන් පොලිසිය මගින් වැන්ග් අත් අඩංගුවට ගන්නා ලදී. වැන්ග් මානව හිමිකම් පිළිබඳ අන්තර් ජාතික ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ රිකෝහි ඉහළම අධිකරණයේ නඩු පැවරීමට අදහස් කරන අතර රිකෝ රාජ්‍යය සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) අපරාණුමත කර ඇත.